**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ අතිරික්තය රු.647,027 ක් වුවද එය සමුච්චිත අරමුදලට මාරු කිරීමේදී රු.617,027 ක් ලෙස සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.15,000 ක් වූ ලී බඩු හා උපකරණ වියදම ආදායම් හා වියදම් ගිණුමට සටහන් කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ණය පදනම මත ලබා දී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී 2014 අගෝස්තු 20 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව වාර්ෂිකව අය කර ඇති වාරික ප්‍රමාණය පමණක් ප්‍රාග්ධනිත කළ යුතු විය.සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවා තිබූ වාරික වටිනාකම රු.1,412,546 ක් වුවත් සම්පූර්ණ වටිනාකම ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් වර්ෂය අවසානයේ මෝටර් රථ හා කරත්ත ගිණුමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂයන් රු.1,765,911 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණවලින් අඩු කර තිබූ රු.756,721 ක් වූ රථයේ ණය වාරික ඉහත ලිපියේ උපදෙස් ප්‍රකාරව ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් උපයෝගී සේවා ගිණුමේ ශේෂය වැඩියෙන්ද හා පළාත් සභා ණය ගිණුමේ ශේෂයෙන්ද වර්ෂයේ ආදායම හා වියදම අඩුවෙන්ද දැක්වුණි.

(ඉ) එසේම ඉකුත් වර්ෂයේ අය කර තිබූ රු.655,825 ක් වූ වාරික මුදල් සමාලෝචිත වර්ෂයේ ගිණුම් ගත කිරීමේදී වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමට එකතු විය යුතු මුදල සමුච්චිත අරමුදල් ගිණුමට ගිණුම් ගත කර නොතිබූ අතර වියදම පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) කැබ් රථයක අලුත්වැඩියාව වෙනුවෙන් පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තුවලින් අඩු කර ගෙන තිබූ රු.50,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(උ) මීට අමතරව මෙම අලුත්වැඩියාව සඳහා තව දුරටත් ගෙවිය යුතු මුදල සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සභාවට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණයෙන් අඩු

කර ගෙන තිබූ රු.250,000 ක් ණය හිමි ගිණුම හර කර ආදායම් ආධාර ගිණුම බැර කළ යුතු වුවත් විවිධ ණය හිමි ගිණුම වෙනුවට ප්‍රාග්ධන වියදම් හර කර තිබුණි.

(ඌ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගෙන තිබූ ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.1,525,713 කින් රු.1,284,841 ක් ණය ගිණුමෙන් අඩු කර තිබූ අතර ඉතිරි රු.240,872 ක් වූ පොලී හා බැංකු ගාස්තු ආදායම් හා වියදම් ගිණුමට සටහන් කර නොතිබුණි.

(එ) ණය හිමි ප්‍රතිපාදන සළසා නොතිබූ රු.31,250 ක් සඳහා ගෙවීම් කිරීමේදී ණය හිමි ගිණුම හර කිරීම නිසා වූ වරද නිවැරදි කිරීම සඳහා රු.31,250 ක් සමුච්චිත අරමුදල් ගිණුම හර කර හිමි ගිණු බැර කිරීම වෙනුවට ගිණුම පමණක් හර කර තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ සභා කර්මාන්ත වියදම වූ රු.1,581,665 ක් ගිණුම් ගත කර නොතිබීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණය හිමි ගිණුමට ගිණුම් ගත කිරීම වෙනුවට අවිනිශ්චිත ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ පිළවෙලින් යන්ත්‍ර හා උපකරණ හා පුස්තකාල පොත් පරිත්‍යාග රු.1,687,774 ක් හා රු.119,817 ක් පරිත්‍යාග ගිණුමට ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මුදල් හා මුදල් සමාන දෑ .3,230,224 ක් වුවද පිළියෙළ කර තිබූ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව එය රු.107,708,943 ක් ලෙස දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.358,309,497 ක් වූ ගිණුම් ශේෂ 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,288,036 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,408,718 ක් විය.

2.2 බැංකු ගිණුම්

---------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය ලැබේ.

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශවල දිගින් දිගටමඇතුළත් කර ඇති එකතුව රු.2,394,836 ක් වූ ගිණුම් අතර මුදල් මාරු කිරීම්,ඍජු බැර කිරීම් නිරවුල් කිරීමට විගණිත දිනය වූ 2015 ජූලි 03 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නොතිබූ රු.343,683 ක් වූ චෙක්පත් හා මුදල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 188(2) විධිවිධාන අනුව කටයුතු කර නොතිබූ අතර මීට ඇතුළත් සමහර ශේෂයන් 2010 සහ 2011 වර්ෂයන්ට අදාළ ඒවා විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ ජංගම ගිණුම් දෙකකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.360,646 ක් වූ චෙක්පත් 107 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2015 ජූලි 03 වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ දිගු පමාවක් විය.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | 2,783 | 1,658 | 2,267 |
| බදු කුලී | 29 | 29 | - |
| බලපත්‍ර ගාස්තු | 5,000 | 4,637 | 326 |

2.3.2 වරිපනම් බදු

---------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,852,765 ක් වූ අතර 2015 ජූනි 30 දිනට ඉන් රු.294,932 ක් හෙවත් සියයට 16 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.3.3 අක්කර බදු

-------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.70,268 ක් වූ අතර 2015 ජූනි 30 දිනට ඉන් රු.9,048 ක් එනම් සියයට 12.8 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.3.4 කර්මාන්ත බදු

------------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ශේෂය රු.119,210 ක් වූ අතර 2015 ජූනි 30 දිනට ඉන් රු.49,000 ක් එනම් සියයට 41 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.3.5 ව්‍යාපාර බදු

--------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.225,040 ක් වූ අතර 2015 ජූනි 30 දිනට ඉන් රු.131,520 ක් එනම් සියයට 58 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.3.6 තොටුපල කුලී හා මස් වෙළඳසැල් කුලී

------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ තොටුපල කුලී හා මස් වෙළඳසැල් කුලී ශේෂය පිළිවෙලින් රු.26,550 ක් හා රු.56,636 ක් වූ අතර ඉන් 2015 ජූනි 30 දිනට තොටුපල කුලී රු.14,000 ක් අය කර ගෙන තිබුණද, මස් වෙළඳසැල් කුලී කිසිවක් අය කර ගෙන නොතිබුණි.

2.3.7 ඉඩම් වෙන්දේසි කිරීම

-------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකිණුම් මිලෙන් සියයට 1 ක ආදායමක් සභාව ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් නිශ්චය කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට 1 ක මුදල වශයෙන් ඉඩම් විකිණීම් දෙකකින් රු.224,357 ක් 2014

වර්ෂයේදී ලබාගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොළ විකිණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.6,607,115 ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 අවිධිමත් ගනුදෙනු

----------------------

හියුම් පයිප්ප මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකට 2014 ජනවාරි 22 දින රු.78,000 ක් ගෙවා තිබුණි.මෙම වියදම සභාවට ඉදිරිපත් කර සභාවේ අනුමත කර ගැනීම වෙනුවට සභාවේ ලේකම්වරයාට හා සභාපතිවරයාට අනුමත කළ හැකි ලෙස රු.10,000 ට අඩු වන පරිදි ගෙවීම් වවුචර්පත් 10 ක් සකස් කර එක් චෙක්පතකින් ගෙවීම් සිදු කර තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) ඉදි කිරීම්

-----------

2015 ජුලි 09 දින පහත සඳහන් ඉදි කිරීම් පිළිබඳ සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය .

i. ගල්ලනහේන මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරීම - පිරිවැය රු.200,000

-------------------------------------------------------------------------------------

- ඉහත ව්‍යාපෘති ඇස්තමේන්තුවේ විෂය අංක (12) යටතේ (12′×12′×15′) ප්‍රමාණයෙන් ආරක්ෂිත ගල් 12 ක් සකසා සවි කිරීම වෙනුවෙන් රු.14,012 ක් ඇස්තමේන්තු කර එම මුදල ගෙවා තිබුණද සකසා තිබුණේ එම ප්‍රමාණයේ ආරක්ෂිත ගල් 06 ක් පමණි.
- ඇස්තමේන්තු විෂය අංක (13) යටතේ ව්‍යාපෘතියේ නාමපුවරුව සැකසීම වෙනුවෙන් රු.6,000 ක් ඇස්තමේන්තු කර එම මුදලම ගෙවා තිබුණද එවැනි නාමපුවරුවක් සවි කර නොතිබුණි.

ii. නාමපුවරුව සකසා නොතිබීම

-----------------------------------

ව්‍යාපෘති 05 ක් සඳහා නාමපුවරු සැකසීම වෙනුවෙන් එකකට රු.6,000 බැගින් රු.30,000 ක් ඇසමේන්තු කර ගෙවා තිබුණද එම ව්‍යාපෘති සඳහා නාමපුවරු සවිකර නොතිබුණි.

iii. ඉත්තෑපාන සතිපොළ

-------------------------

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ සතිපොළ සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ කඩ කාමර සඳහා තරාදි එල්ලා ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා විගණිත දිනය වූ 2015 ජූලි 03 දින වන විටත් සති පොළ වෙළඳාම සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අත්හැර දැමූ ව්‍යාපෘති

-------------------------

2014 වර්ෂය තුළ වැඩ ආරම්භ කළ ඇස්තමේන්තුගත වටිනාකම රු.1,312,000 ක් වූ ව්‍යාපෘති 02 ක් විගණිත දිනය වූ 2015 ජූලි 03 වන විටත් වැඩ අවසන් නොකර අතරමග නවතා තිබුණි.

(ඇ) එකම කාලසීමාවක් තුළ එකම සමිතියකින් ඉදිකිරීම් කොන්ත්‍රාත් කිහිපයක් ඉටු කිරීම

------------------------------------------------------------------------------------------

2012 ජනවාරි 05 දිනැති 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී ,අදාළ ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත්, එකී නියමයට පටහැනිව එකම කාලසීමාවක් තුළ සමිති 03 ක් විසින් කොන්ත්‍රාත් 04 ත් 07 ත් අතර ප්‍රමාණයක් සිදුකර තිබුණි.

(ඈ) හියුම් පයිප්ප නිකුත් කිරීම

-----------------------------

2015 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.266,700 ක් වූ විවිධ ප්‍රමාණයෙන් යුතු හියුම් පයිප්ප 46 ක ගුණත්වය පිළිබද ගැටළු මතුවීම හේතුවෙන් එම හියුම් පයිප්ප ව්‍යාපෘති සඳහා නිකුත් කිරීම් අත්හිටුවන ලෙසට කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් සභාවේ ලේකම් වෙත දැනුම් දී තිබුණද විගණිත දිනය වූ 2015 ජූලි 09 වන විටත් ඉන් පයිප්ප 28 භාවිතය සඳහා නිකුත් කර තිබුණි.ඉතිරි හියුම් පයිප්ප 18 ඉත්තැපාන උප කාර්යාලයේ හා වලල්ලාවිට සබා භූමියේ ගබඩාවේ තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රු.17,550 කට මිලදී ගෙන තිබූ හියුම් පයිප්ප 04 ක් පුස්සවෙල මාර්ගයට නිකුත් කර තිබූ බව සටහන් කර තිබුණද 2015 ජූලි 09 දින භෞතික පරීක්ෂාවේදී මෙම හියුම් පයිප්ප යොදා ඇති ස්ථාන පෙන්වා දීමට තාක්ෂණික නිලධාරී අසමත් විය.

3.3 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට 2013 දක්වා ලබා දී තිබූ රු.204,440 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වූ 2015 ජූලි 03 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2004 ජූලි 09 දිනැති අංක LG/05/2004 දරන චක්‍රලේඛයේ 02 ඡේදයේ නියමය පරිදි ඇප තැබිය යුතු සේවකයින් 19 දෙනෙකුගෙන් ඇප මුදල්ද අය කර නොතිබුණි.

(ඇ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරු වී ගොස් තිබූ හා සේවය හැර ගොස් සිටි නිලධාරින් 11 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ සේවක ණය රු.105,183 ක් විගණිත දිනය වූ 2015 ජූලි 09 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවේ ආදායම් වාර්තාවලට අනුව 2014 වර්ෂය තුළ වලල්ලාවිට ප්‍රධාන කාර්යාලය කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් රු.18,000 ක ආදායමක් ලබාගෙන තිබුණද නිෂ්පාදනය කළ පොහොර ප්‍රමාණය හා ඉතිරි තොගය පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා තොග පොත් පවත්වා නොතිබුණි.

(ඉ) සේවක අර්ථසාධක අරමුදල,සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල,විවිධ බැංකු හා සංගම් වෙත ප්‍රේෂණය කිරීම සඳහා 2011 වර්ෂයේ සිට 2013 දක්වා සභාවේ සේවකයින්ගේ වැටුප්වලින් අවකරණය කර තිබූ රු.283,400 ක් වූ මුදල් විගණිත දිනය වූ 2015 ජූලි 09 දින වන විටත් අදාළ ආයතන වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

3.4 වාහන පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු කිසිදු වාහනයක් සම්බන්ධයෙන් ලොග් පොත් නඩත්තු කර නොතිබුණි.

(ආ) වාහන අළුත්වැඩියා කිරීමේදී හෝ අමතර කොටස් ඉවත් කිරීමේදී ඉවත් නරනු ලබන අමතර කොටස් හා උපකරණ,මෙවලම්,භාණ්ඩ විස්තර දක්වමින් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේදී අළුත්වැඩියාව සඳහා ගරාජ්වලට භාර දී තිබූ වාහන 02 ක් විගණිත දිනය වූ 2015 ජූලි මස 09 දින වන විටත් ආපසු භාර දී නොතිබුණි.

3.5 මානව සම්පත් කළමණාකරණය

-----------------------------------

I. සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයසේවකයන් 07 දෙනෙකුගේ ඌණතාවයක්ද ,09 දෙනෙකුගේ අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

II. මීට අමතරව අනියම් ආයුර්වේද වෛද්‍ය නිලධාරී 02 ක්,අනියම් සේවකයන් 04 දෙනෙක් හා උපාධිධාරී අභාසලාභී නිලධාරිනියක් සේවයේ යොදවාගෙන සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) වාහන උපයෝජනය

(උ) කාර්ය මණ්ඩල කළමනාකරණය

(ඌ) කොන්ත්‍රාත් පරිපාලනය